**නිපුණතා මට්ටම 1.1 නාට්‍යය ක්‍රියාකාරකම් හඳුනා ගනියි.**

- ඔබ සෙල්ලම් ගෙවල් සාදා එහි සෙල්ලම් කරන විටදී එතන සිදුවන්නේ නාට්‍යය ක්‍රියාකාරකමක් බව ඒ පිළිබඳව හොඳින් මෙනෙහි කළ විට ඔබට සිහිවෙයි.
- ඔබ මින් පෙර සිදුවූ සිදුවීමක් තවත් කෙනෙකුට හෝ පිරිසකට සිදුකර පෙන්වන විටදී හෝ මින් පෙර පැවසූ කතාවක් තවත් කෙනෙකුට පවසන විටදී  ඔබ නාට්‍යයම ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- ඔබ හයවසර ඉගෙනුම ලබන විටදී නාට්‍යය ක්‍රියාකාරකම් යනු මොනවාද යන්න සොයා බැලීම සිදුකළ බැවින් නැවත ඒ පිළිබඳව සිහිකරන්න. එවිට ඔබට එම අවස්ථාවන්වලදී ඔබ සිදුකරන නාට්‍යයමය ක්‍රියාකාරකම් පිළිබඳව වැටහිමක් ඇතිවේ.
- ඔබ සෙල්ලම් ගෙයක් හෝ සෙල්ලම් පංති කාමරයක් හෝ සෙල්ලම් වෙළඳපළක් සිදුකරන්නේ යැයි සිතන්න.





- අපි සෙල්ලම් ගෙයක් නිර්මාණය කරන විටදී එහි සිටින්නේ කවුරුන්ද යනුවෙන් **චරිත** බෙදා ගනියි.
- එම චරිත සිදුකිරීම සඳහා චරිතවලට සමාරෝපය වෙයි. ( ඇතුල් වෙයි. )
- 
- අපි සෙල්ලම් ගෙදර හෝ සෙල්ලම් පංති කාමරයේ විවිධ චරිත නිරූපණය කිරීමට සූදානම් වෙමු. අපි ඒ ඒ චරිත බෙදා ගැනීමක් සිදුකරමු. ඒ අනුව අම්මා, තාත්තා, සීයා, ආච්චි, මාමා, නැන්දා, මල්ලී, නංගි, අයියා, අක්කා, ගුරුතුමිය, ගොවිමහතා, පොලිස් මහතා, තැපැල් මාමා, වැනි චරිත බෙදා ගෙන එම චරිත හැසිරීම අනුව හැසිරීමට උත්සහ ගනියි. මේ ආකාරයට ඔබ චරිත සිදු කිරීමට පටන් ගනි. **චරිත** රංගනය යනු නාට්‍යයේ ඇති ප්‍රධානම අංගය වෙයි.





- අපි සියලුම දේවල් ඇත්තටම සිදුකරන්නේ නැත. සමහර දේවල් සිදුවූ ආකාරයෙන් ඉදිරිපත් කිරීමක් සිදුකරයි.
- අපි කටහඬ වෙනස්කර ගනියි. ඇවිදීම වෙනස් කර ගනියි. වෙනත් කෙනෙකු ලෙසින් හැසිරීමට (**අනුකරණය**  කිරීමට) පටන් ගනියි.
- අපි තාත්තා ලෙසින් අනුකරණයක් කරමු. ඒ සඳහා තාත්තාට උචිත ඇඳුම් ඇඳ, තාත්තා මෙන් රැවුලක් දමා, තාත්තා මෙන් ඇවිදිමින් ,තාත්තා මෙන් කතා කිරීමට පටන් ගනියි.

නැතිනම් අපි සෙල්ලම් පාසලක් සිදුකරන විටදි අපි ගුරුතුමියක් ලෙසින් ඇඳුම් ඇඳ, පොත්

මිටියක් ගෙන, ඇවිදීමට, හඬ පවත්වා ගැනීමට පටන් ගනියි. මෙම සිදුවීම් **අනුකරණය** නැමැති නාට්‍යය අංගය බව දැන් ඔබට සිහිවෙනු ඇත.





- අපි ඒ ඒ චරිතවලට සමාන වෙමින් **සංවාද** භාවිතා කිරීමට පටන් ගනියි.
- තාත්තා මෙන් හෝ අම්මා මෙන් හෝ පොඩි බබෙකු මෙන් අපි දෙබස් පවසමු. ඇතැම් විට අපි හඬ ගොරෝසු කර ගනියි. නැතිනම් සිහින් හඬකින් හෝ වයස්ගත හඬකින් කතා කරන්නට පටන් ගනිමු. නැතිනම් අපි ගොත ගසා හෝ කතා කිරීමට නොහැකි අයෙකු ලෙසින් හඬ හසුරුවන්නට පටන් ගනිමු. ඒ ඔබ සිදුකරන්නේ නාට්‍යයේ ප්‍රධාන අංගයක් වන **සංවාද** හැසීරිම බව දැන් ඔබට සිතෙනු ඇත.





මේ අනුව නාට්‍යවලට අවැසිම **චරිත ,** **සංවාද ,** **අනුකරණය** වැනි දේ අපි සෙල්ලම් ගෙවල් සැදිමේ දී සිදු කරන නාට්‍යමය අංගයන් වන බව ඔබට පැහැදිලි වනු ඇත.